ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013/01/01 |

## 2012 වසරේ දී උද්ධමනය අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමෙහි පැවතිණි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය 2012 දෙසැම්බර් මාසයේ දී නොකඩවා 47 වැනි වරටත් ඒකාංක මට්ටමක පැවතිණි. ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය 2012 නොවැම්බර් මාසයේ පැවති සියයට 9.5 හි සිට දෙසැම්බර් මාසයේ දී සියයට 9.2 දක්වා පහළ වැටිණි. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය 2012 නොවැම්බර් මාසයේ පැවති සියයට 7.2 හි සිට දෙසැම්බර් මාසයේ දී සියයට 7.6 දක්වා ඉහළ නැගිණි.




කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙන් නැවුම් ආහාර, බලශක්ති, ප්‍රවාහන, සහල් සහ පොල් යන අයිතමයන් ඉවත් කොට ගණනය කරනු ලබන මූලික උද්ධමනය ලක්ෂ්‍යාමය හා වාර්ෂික සාමාන්‍යය යන දෙයාකාරයේම පදනම මත පිළිවෙළින් පූර්ව මාසයේ පැවති සියයට 7.2 හා සියයට 5.6 හි සිට 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 7.6 හා සියයට 5.8 දක්වා ඉහළ නැගිණි.

**2012 වසරේ මිල විචලනයන්**

**2011 දෙසැම්බර් මාසයේ සියයට 6.7 ක්ව පැවති වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 2012 මැයි මාසයේ දී සියයට 5.6 දක්වා අඛණ්ඩව පහත වැටිණි.** කෙසේ වුවද, ඉන්පසුව මෙම නැඹුරුව ප්‍රතිවර්තනය වෙමින් 2012 දෙසැම්බර් මාසයේ දී සියයට 7.6 දක්වා වැඩි විය. ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් ඉහළ යාම (සියයට 10.0 කින්) දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ඒ අනුව, පෙර වර්ෂය හා සසඳන විට රෙදිපිළි හා පාවහන් (සියයට 9.8 කින්); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 9.6 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 6.7 කින්); සෞඛ්‍යය (සියයට 3.0 කින්); ප්‍රවාහන (සියයට 21.6 කින්); විනෝදාත්මක හා

සංස්කෘතික (සියයට 4.0 කින්); අධ්‍යාපන (සියයට 0.5 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 4.1 කින්) යන උප කාණ්ඩයන්හි සාමාන්‍ය මිල ගණන් 2012 වසරේ දී ඉහළ නැගිණි. මේ අතර, ආහාර කාණ්ඩයේ මිල ගණන් ද සියයට 4.7 කින් ඉහළ නැගිණි. කෙසේ වුවද, සන්නිවේදන උපකාණ්ඩයේ මිල ගණන් වර්ෂය තුළ දී නොවෙනස්ව පැවතිණි.

**ප්‍රධාන වශයෙන්ම, නියං තත්ත්වය නිසා දැඩි ලෙස හානියට පත් යල කන්නයේ වී අස්වැන්න අඩුවීම හේතු කොටගෙන 2011 වසරට සාපේක්ෂව 2012 වසරේ දී සහල්වල සාමාන්‍ය මිල සියයට 0.7 කින් මද වශයෙන් ඉහළ නැගිණි.** 2012 ජනවාරි සිට මැයි මාසය දක්වා සෑම සහල් වර්ගයකම පාහේ මිල ගණන් නොකඩවා පහත වැටුණ ද, 2012 ජුනි මස පටන් ඉහළ යාම ඇරඹිණි. කෙසේ වුවද, 2011/12 මහ කන්නයේ වාර්තා වූ විශාල වී අස්වැන්න සහ 2010 වසර අග භාගයේ සිට රජය මගින් සහල් මත පැන වූ උපරිම මිල සීමාව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහල් මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා උපකාරී විය.

**2012 වසරේ දී එළවළුවල හරිත සාමාන්‍ය මිල ගණන්වල පෙර වසරට සාපේක්ෂව සියයට 3 ක පමණ අඩුවීමක් වාර්තා විය.** සැපයුම් තත්ත්වයන්හි සිදුවූ වර්ධනය හේතුවෙන් පෙබරවාරි මාසයේ දී සෑම එළවළු වර්ගයකම පාහේ මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මාර්තු - අප්‍රේල් කාලසීමාවේ දී අඩුතම මිල ගණන් වාර්තා විය. කෙසේ වුවද, 2012 මැයි - ජූලි සහ නොවැම්බර් - දෙසැම්බර් යන කාලසීමාවලදී ප්‍රධාන වශයෙන්ම දිවයිනෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුකොට ගෙන මිල ගණන් ඉහළ නැගිණි. ඉහත මිල වර්ධනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් 2012 වසරේ දී, එළවළු උපකාණ්ඩයේ හරිත සාමාන්‍ය මිලෙහි පහළ යාමක් වාර්තා විය.

**2011 වසර හා සැසඳීමේ දී 2012 වසරේ දී පොල් හා පොල් තෙල් යන දෙකෙහිම සාමාන්‍ය මිල ගණන් පහත වැටිණි.** 2012 පළමු මාස පහ තුළ දී ඉහළ මට්ටමක පැවති පොල් මිල ගණන්, එතැන් සිට සැලකිය යුතු ලෙස පහත වැටෙමින්, 2012 අගෝස්තු මාසයේ දී අඩුතම මට්ටම වාර්තා කළේය. කෙසේ වුවද, එතැන් සිට එහි

ඉහළ යාමේ නැඹුරුවක් දක්නට ලැබිණි. වසර අවසාන භාගයේ පොල් තෙල් මිල ඉහළ ගියද, 2012 පෙබරවාරි - මාර්තු කාලසීමාවේ දී වාර්තා වූ අඩු මට්ටමේ සිට තවදුරටත් පහළ වැටෙමින් 2012 සැප්තැම්බර් මසදී එය අඩුතම මට්ටම වාර්තා කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2012 වසරේ දී පොල් හා පොල් තෙල් යන දෙවර්ගයෙහිම සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් සියයට 19.2 කින් හා සියයට 21.9 කින් පහත වැටිණි.

**2011 වසරට සාපේක්ෂව 2012 වසරේ දී නැවුම් මත්ස්‍ය හා මුහුදු ආහාරවල හරිත සාමාන්‍ය මිල සියයට 10.2 කින් ඉහළ නැගිණි.** කෙසේ වුවද, සෘතුමය සාධක හේතුවෙන් පෙබරවාරි සිට අප්‍රේල් දක්වා කාලසීමාවේදී ලොකු කුඩා මාළු දෙවර්ගයේම බර තැබූ සාමාන්‍ය මිල ගණන් පහළ මට්ටමක පැවතිණි. මේ අතර, ඉහළ ගිය මාළු මිල ගණන් අනුව යමින් සියලුම වර්ගවල කරවල මිල ගණන් 2012 වසරේ දී ඉහළ නැගිණි. මෙයට ප්‍රතිවිරුද්ධව, ප්‍රධාන වශයෙන්ම දේශීය නිෂ්පාදනයේ වර්ධනය හේතුවෙන් 2011 වසරට සාපේක්ෂව 2012 වසරේ දී බිත්තර මිල ගණන් සියයට 6.7 කින් පහත වැටිණි.

**තවද, අන්තර්ජාතික වෙළෙඳපොළේ මිල විචලනයන් අනුව යමින් ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්, එල්.පී. ගෑස්, තිරිඟු පිටි, පාන් සහ කිරිපිටි මිල ඉහළ නංවමින් සිදු කළ සංශෝධන ද කො.පා.මි. දර්ශකය මත පීඩනයක් ඇති කළේය.** ඉන්ධන මිල ඉහළ නැංවීම මුල් කොටගෙන, ඉන් අනතුරුව බස් ගාස්තු සහ විදුලිය ගාස්තු සංශෝධනය කිරීම ද උද්ධමනය ඉහළ නැංවීම කෙරෙහි දායක විය. තවද, සීනි, පරිප්පු, ලොකු ළූණු, උම්බලකඩ සහ සුදුළූණු වැනි ආනයනික භාණ්ඩ කිහිපයක් මත වූ බදු ඉහළ නැංවීම මෙන්ම ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම උද්ධමනය මත පීඩනයක් ඇති කළේය. කෙසේ වුවද, එළවළු සැපයුමෙහි වර්ධනය සහ ඇතැම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත වූ ආනයන බදු පහළ දැමීම, පොදු මිල මට්ටම කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළේය.